**සීමාසහිත නෝර්ත්සී - 2020/2023**
**--------------------------------------**

සීමාසහිත නෝර්ත්සී හි 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරවමාගේ විධානය යටතේ සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදිස්වකීය ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යා යුතුය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 මාර්තු 31 දිනෙන් හා 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා2024 අගෝස්තු 25 වන දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම් වල පැවැත්ම**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2021 මාර්තු 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | **21/2020** | **20/2019** |
|---|---|---|
| | **රු.** | **රු.** |
| ජංගම නොවන වත්කම් | 250,938,389 | 284,221,302 |
| ජංගම වත්කම් | 89,194,058 | 82,457,994 |
| මුළු වත්කම් | 340,132,447 | 366,679,296 |
| හිමිකම් | (259,756,536) | (176,321,640) |
| ජංගම නොවන වගකීම් | 482,478,567 | 469,688,332 |
| ජංගම වගකීම් | 117,410,416 | 73,312,603 |
| මුළු හිමිකම් හා වගකීම් | 340,132,447 | 366,679,295 |
| ආදායම් | 269,066,886 | 258,829,633 |
| වියදම් | 358,345,758 | 376,990,294 |
| බදු පසු ලාභය(අලාභය)/ | (89,278,872) | (118,160,661) |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය | මෙම පනත අදාළ වන සෑම සේවායෝජකයෙකු විසින්ම එක් එක් සේවකයා වෙනුවෙන් සේවකයාගේ දායකත්වය හා සේවා යෝජකගේ දායකත්වය ගණනය කර ඊළඟ මාසයේ අවසන් දිනට පෙර අරමුදලට ගෙවිය යුතුය. නමුත් 2020 ජුලි මස සිට 2023 මාර්තු 31 දක්වා එකතුව රු.51,451,021 ක්වූ දායක මුදල විගණිත දිනය වූ 2024 මාර්තු 31 දින දක්වාම සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | 2023 මාර්තු 31 දින දක්වා ගෙවිය යුතු සේවක අර්ථසාධක දායක මුදලේ හිග ශේෂය වන රු.51,471,021 ක් වූ මුදලින් අද දින වන විට ගෙවා ඇති මුදල රු.1,059,167.81 කි. ඒ අනුව ඉතිරිය ගෙවීමට ඇති මුදල රු.50,411,854 කි. වීරවිල කර්මාන්තශාලාවට අයත් හිග මුදල සඳහා ගරු අධිකරණය විසින් ලබා දි ඇති නියෝගය අනුව ගෙවීම් කිරිම වාරික වශයෙන් සිදු කරයි. | සේවකයාගේ ඉපැයීම්වලින් අර්ථසාධක දායකත්ව මුදල අඩු කරඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. |
| (ආ) | 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16(1) වගන්තිය | මෙම පනත අදාළ වන සෑම සේවා යෝජකයෙකුවිසින් සේවකයන් සේවයේ යොදවා ඇති සෑම මාසයකම, එම සේවකයන් සම්බන්ධයෙන් සේවකයා උපයනු ලබන මුළු ඉපැයීම් වලින් සියයට තුනකට සමාන මුදලක් දායක මුදල් වශයෙන් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කිරීමට බැඳී සිටියි .එසේ වුවද සමාගම විසින් ඊට අනුගත නොවී 2021 සැප්තැම්බර් මස සිට 2023 මාර්තු දක්වා කාලයට අදාළව රු.4,139,226 ක දායකත්ව මුදලක් විගණිත දිනය වූ 2024 මාර්තු 31 වන දින වන විටත් අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියට ගෙවීමට ඇති මුදල රු.3,674,194 කි. එය වාරික 12 කින් ගෙවා අවසන් කිරිම සඳහා සේවක භාරකාර අරමුදල සමග එකගතාවයකට එළඹ ඇත. | එක් එක් සේවකයාට අදාළ සේවක භාරකාර දායකත්ව මුදල අඩු කර ඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18(4) වගන්තිය | ඉන්වොයිස් නිකුත් කළ දින සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු පියවිය යුතු වුවද මෙම සමාගම විසින් 2015/16 ගිණුම් වර්ෂයේ සිට 2020/21 ගිණුම් වර්ෂය දක්වා වූ කාලයට අදාලව රු.1,979,100 ක්වූ | දැනට ගෙවිය යුතු ලෙස පවතින විගණන ගාස්තුව වන රු.1,979,100 ක මුදල අද දින වන විට ගෙවා නොමැති බව දන්වා සිටිමි. එම මුදල ආයතනයේ ආදායම වැඩි කිරිම | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18(4) වගන්තිය ප්‍රකාරව වූ විගණන ගාස්තුව ගෙවීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | විගණන ගාස්තු විගණිත දිනය වූ 2024 මාර්තු 31 වන දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග අනුව ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරනු ලබන බව දන්වා සිටිමි. | |
| (ඇ) | 2007 අංක 7 දරන සමාගම් පනතේ 50(1) වගන්තිය | සමාගම විසින් කොටස් නිකුත් කිරීමේදී සංස්ථාගත කිරීම සඳහා වන අයදුම්පතෙහි නම් කර ඇති සෑම කොටස් හිමියෙකුටම එහි 5වන වගන්තිය යටතේ සංස්ථාගත කළ වහාම එම පුද්ගලයාට හිමි කොටස් සහතික නිකුත් කළ යුතු වුවත් සමාගම 2001 දී සංස්ථාගත කර 2007 සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර කොටස් නිකුත් කර තිබුණද අදාළ කොටස් හිමියන්ට විගණිත දින වන 2024 මාර්තු 24 දක්වාම කොටස් සහතික නිකුත් කර නොතිබුණි. | අද දින වන විටත් සහතික නිකුත් කර නොමැත. | කොටස් හිමියන්ට කොටස් සහතික නිකුත් කළ යුතුය. |
| (ඉ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2023 දෙසැම්බර් 31 දිනට රු.144,271,952 ක්වූ එකතු කළ අගය මත බදු මුදල් ශේෂය විගණිත දිනය වූ 2024 මාර්තු 27 දිනවන විටත් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 වන දිනට ඇති රු.144,271,952 ක්වූ එකතු කල අගය මත වූ බදු මුදල සඳහා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමග ඇති කරගත් එකගතාවය මත දැනට ආයතනයේ ඇති ආදායම අනුව මසකට රු100,000 මුදලක් බැගින් ගෙවීම් සිදුකරන බව දන්වා සිටිමි. | එකතු කළ අගය මත බදු මුදල් ශේෂය දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | සමාගම විසින් 2023 වර්ෂය අවසන් වන විට ජාතිය ගොඩනැගීමේ බදු මුදල හා ඊට අදාළ දඩ මුදල්ද සමගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.20,455,629 ක ශේෂය විගණිත දින වන විට 2024 මාර්තු 24 දින වන විටත් ප්‍රේෂණය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය අවසන් වන විට ඇති ජාතිය ගොඩනැගිමේ බදු මුදල වන රු.20,455,629 ක වන මුදලින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අධිකරණයේ නඩු පැවරිමක් සිදු කළ මුදල වන රු.12,838,881 ක් මුදල අධිකරණය වෙත ගෙවා ඇත. | ජාතිය ගොඩනැගීමේ බදු මුදල හා ඊට අදාල දඩ මුදල් සමගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (උ) | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ 2006 මාර්තු 01 දිනැති | භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී, 2006 භාණ්ඩ සහ වැඩ සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | 2022/2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ 2006 මාර්තු 01 දිනැති |

| | | | |
|---|---|---|---|
| අංක 9 දරන චක්‍රලේඛය | සංග්‍රහයෙහි මාර්ගෝපදේශ හා ඊට අදාළ අත්පොතෙහි සඳහන් පරිදි උපරිම ආර්ථික වාසි සලසා ගැනීම, නියමිත ප්‍රමිතීන්ට, පිරිවිතරවලට හා නීතිරීති රෙගුලාසි වලට අනුකූලව විනිවිදභාවයකින් කටයුතු කළ යුතුව තිබුණද ඊට අනුගත නොවී 2022/2023 වර්ෂයේදී රු.17,595,099 ක්වූ අමුද්‍රව්‍ය සමාගම විසින් මිලදීගෙන තිබුණි. | | අංක 9 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති යහපාලන පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය, හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කළ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපාරය මෙහෙයවීමට මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳව දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022/23 වර්ෂයන් ආවරණය වන පරිදි ව්‍යාපාර සැලැස්මක් විගණිත දිනය වන 2024 මාර්තු 27 දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කාලසීමාව සඳහා සකස් කළ ව්‍යාපාර සැලැස්ම ආයතන ලේඛණ තුල නොමැති බව දන්වා සිටිමි. | අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති යහපාලන පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය, හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කළ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර එයරේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05(02) ඡේදය හා අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්ති ප්‍රකාරව ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද සමාගම විසින් 2022/23 මූල්‍ය වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මෙම කාලසීමාව සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම ආයතන ලේඛණ තුල නොමැති බව දන්වා සිටිමි. | අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05(02) ඡේදය හා අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්ති ප්‍රකාරව ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ඡේදය අනුව සමාගම විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉන් පසු එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හි දක්වා ඇති කරුණු ද ඇතුළත්ව මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් පිළියෙළ කළ යුතු වුවද සමාගම විසින්2022/23 මූල්‍ය වර්ෂය සඳහාඑවැනි ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2022/2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා ඉන් පසු එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ඇතුළත්ව මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාගම සතුව පවතින රු.2,833,333 ක් වූ ඉඩම්, රු.16,655,380 ක්වූ ගොඩනැගිලි හා රු.446,270,210 ක්වූ අනෙකුත් වත්කම් වසර තුනකට හෝ වසර පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද සමාගම සතු එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය සතුව ඇති ඉඩම් හා ගොඩනැගිලි සඳහාදක්වන වටිනාකම් වසර 10 කට පමණ පෙර පොත්වල සඳහන් වූඅගය බව ඔබතුමා වෙත දන්වා සිටිමි.එම වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කිරිමක්නොතිබුණි.ඉදිරියේදි එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරිම සඳහාඅවශ්‍ය කටයුතු සුදානම් කරන බව දන්වා සිටිමි. | සමාගම සතුව පවතින වත්කම් වසර තුනකට හෝ වසර පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වේ. |
| (ආ) | 2020/21 මූල්‍ය ප්‍රකාශන අනුව දිගින් දිගටම නිරවුල් නොවී පවතින ලැබිය යුතු ශේෂ රු.21,474,469ක් හා ගෙවිය යුතු ශේෂ ලෙස රු.247,197,644 ක් නිරවුල් කිරීම විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි. | 2020/2021 මූල්‍ය ප්‍රකාශනය අනුව දක්වා ඇති ලැබිය යුතු මුදල් ශේෂය සහ ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂයන් නිවැරදි බවත් එම ශේෂයන්ට අදාල විස්තර අප ආයතනය සතුව පවතින කර්මාන්තශාලා තුනක් වන අතර ලුණුවිල, වීරවිල, යාපනය යන ආයතන තුල එම තොරතුරු ඇති බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන අනුව දිගින් දිගටම ඉදිරියට එනු ලබන ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 මානව සම්පත් කලමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට2022 මාර්තු11 හා 2022 මාර්තු 25 දින සමාගමේ සභාපති විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි ඉදිරිපත් කර තිබූ අතර එයට ප්‍රතිචාර ලෙස කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා 2022.05.18 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරමින් කරුණු 4ක් සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් ඉල්ලා තිබුණි. නමුත් එම ලිපියට අදාළ තොරතුරු සමාගම විසින් නිවැරදිව විගණන දින වන විටත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.ඒ අනුව කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම ඉතාම අත්‍යාවශ්‍ය කටයුත්තක්ව තිබියදී ඒ සඳහා අවශ්‍ය තොරතුරු සමාගම විසින් ප්‍රමාද කර තිබීම හේතුවෙන් කාර්ය මණ්ඩය අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය තව දුරටත් ප්‍රමාද වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | තනතුරු අනුමත කර ගැනීමට ඉල්ලා සිටින තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සමාගම කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය සඳහා මගපෙන්වීමේ චක්‍රලේඛයේ 7.4.1 ඡේදය සහ 2021 නොවැම්බර් 16 දිනැති 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සෑම මාස තුනකට වරක් එනම් කාර්තුවකට වරක් විගණනය හා කළමනාකරණ කමිටුරැස්වීම් පවත්වා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය ක්‍රියාමාර්ගයන් පිළිබඳ දැනුවත් කළ යුතු වුවද සමාගම විසින් 2022/23 වර්ෂ වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | සෑම කාර්තුවකටම වරක් විගණනය හා කළමනාකරණ රැස්වීම් පැවැත්විය යුතු වුවද එවකට ආයතනයේ පවත්වාගෙන ගිය කළමනාකාරීත්වය හා සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය එම කටයුතු සිදු කර නොමැති බව පෙනී යයි. | අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය සඳහා මගපෙන්වීමේ චක්‍රලේඛයේ 7.4.1 ඡේදය සහ 2021 නොවැම්බර් 16 දිනැති 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව විගණනය හා කළමනාකරණ රැස්වීම් පැවැත්විය යුතුය. |

## 4.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ඡේදය සහ අංක 1/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මසකට එක් වතාවක් වශයෙන් වර්ෂ තුළ වාර දොළහක් රැස්විය යුතු අතර සමාගමේ කාර්ය සාධනය පිළිබඳව මගපෙන්වීමක් හා කාර්යවල ඇගයීමක් සිදුකළ යුතු වුවද 2022/23 මූල්‍ය වර්ෂයට අදාලව අප්‍රේල් හා අගෝස්තු මාසයන්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2ක් පමණක් පවත්වා තිබුණි.තවද 2023 වසරේ ජූලි මාසයෙන් පසු විගණිත දින වන (2024 අගෝස්තු 26) දක්වාම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. | අධ්‍යක්ෂක මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතවරයා 2023.09.18 දින අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වීමත් තවත් අධ්‍යක්ෂවරයෙක් ධුරයෙන් ඉවත් වීමත් හා තවත් අධ්‍යක්ෂවරු දෙදෙනෙක් නියමිත පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී නොවීමත් නිසා නිසි පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකි වී ඇත. | අංක PED 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ඡේදය සහ අංක 1/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. |